**(i)** $SCl_2$ හා $H_2O$ අතර ප්‍රතික්‍රියාව

....................................................................................................

**(ii)** $Cl_{2(g)}$ හා සිසිල් තනුක $NaOH_{(aq)}$

....................................................................................................

5

**03. (a) (i)** $PV = \frac{1}{3} mNC^2$ සමීකරණ භාවිතා කරමින් පරිපූර්ණ වායුවක මධ්‍යන්‍ය මවුලික චාලක ශක්තිය E, $E = \frac{3}{2}RT$ මගින් දෙන බව පෙන්වන්න.

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

Scanned with CamScanner

**(ii)** පරිපූර්ණ වායුවක හා තාත්වික වායුවක සම මවුල හා සම උෂ්ණත්ව තත්ව වලදී, පරිමාව ඉදිරියෙන් පීඩනය වෙනස්වීම **එකම** ප්‍රස්ථාරයක දක්වා නම් කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

**(b)** ජලය හා A නම් කාබනික ද්‍රාවකයක $I_2$ ව්‍යාප්ත කල හැක. ජලය 100.0 $cm^3$ හා A ද්‍රාවකය 50.0 $cm^3$ ගෙන එහි $I_2$ යම් ප්‍රමාණයක් දියකර සමතුලිත වූ විට ජලීය ස්වරයෙන් 20.0 $cm^3$ හා A ස්වරයෙන් 5.0$cm^3$ ගෙන $Na_2S_2O_3$ ද්‍රාවණයක් සමඟ අනුමාපනය කරයි. වැය වූ $Na_2S_2O_3$ පරිමාව 10.0 $cm^3$ හා 20.0 $cm^3$ කි.

**(i)** ඉහත අනුමාපනයට යොදා ගන්නා දර්ශකය නම් කරන්න.

..............................................................................................................................

**(ii)** ඉහත දර්ශකය එකතු කිරීම අනුමාපනය මුලදීම සිදු නොකෙරේ. මෙයට හේතුව කෙටියෙන් ලියන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

**(iii)** ජලය හා A අතර $I_2$ හි ව්‍යාප්ති සංගුණකය $K_D$ අගය ගණනය කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

**(iv)** ඉහත ජලීය ස්ථරයට පරිමාව වෙනස් නොවන පරිදි KI ස්වල්පයක් දමා දිය කරන ලදී. KI කාබනික A තුල ද්‍රාව්‍ය නොවේ. එවිට ජලීය ස්ථරය කල $I_2$ සාන්ද්‍රණය **අඩුවේද, වැඩිවේද වෙනස් නොවේද** යන්න ගුණාත්මකව පහදන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

6

Scanned with CamScanner

**(c)** **(i)** $2PQ_{2(aq)} + R_{2(aq)} \longrightarrow 2PQ_2R_{(aq)}, \Delta H^\theta < 0$

ප්‍රතික්‍රියාව $PQ_2(aq)$ හා $R_2(aq)$ සාන්ද්‍රණ පිළිවෙලින් $2 \times 10^{-5}$ $moldm^{-3}$ හා 1 $moldm^{-3}$ වූ විට ප්‍රතික්‍රියා ශීඝ්‍රතාවය $1 \times 10^{-3}$ $moldm^{-3}s^{-1}$ කි. ප්‍රතික්‍රියාව සිදුවීමේ දී $PQ_2(aq)$ සාන්ද්‍රණය $1 \times 10^{-5}$ $moldm^{-3}$ වූ විට ප්‍රතික්‍රියා ශීඝ්‍රතාවය $5 \times 10^{-4}$ $moldm^{-3}s^{-1}$ බව සොයාගෙන ඇත. $PQ_{2(aq)}$ සාපේක්ෂව **පෙළ** ගණනය කරමින් ලබා ගන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

**(ii)** ඉහත ප්‍රතික්‍රියාවේ යාන්ත්‍රණය පහත **මූලික ප්‍රතික්‍රියා** 2 ක් යුක්ත වෙයි.

$PQ_{2(aq)} + R_{2(aq)} \longrightarrow PQ_2R_{(aq)} + R_{(aq)}$ සෙමින්

$PQ_{2(aq)} + R_{(aq)} \longrightarrow PQ_2R_{(aq)}$ ; වේගයෙන්

ප්‍රතික්‍රියා යාන්ත්‍රණය ඇසුරෙන් $R_{2(aq)}$ අනුබද්ධයෙන් පෙළ සොයන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

**(iii)** සෙමින් සිදුවන ප්‍රතික්‍රියාව තාප අවශෝෂක ලෙස සලකා ඉහත (c) හි (i) ප්‍රතික්‍රියාවේ ශක්ති පැතිකඩ අඳින්න. එහි ප්‍රතික්‍රියක හා ඵල වල අඩංගු ස්ථාන පෙන්වා දෙන්න. එන්තැල්පි විපර්යාස $\Delta H$ ලකුණු කරන්න. දෙවන පියවරේ ආපසු ප්‍රතික්‍රියාවේ **සක්‍රියන ශක්තිය** $E_a$ ලකුණු කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

7

Scanned with CamScanner

**04. (a)** $C_6H_{12}O$ යන **එකම අණුක සූත්‍රය** ඇති A, B, C සංයෝග **ව්‍යුහ සූත්‍ර** වල වෙනස්කම් දරයි. A, B හි ප්‍රධාන කාබන් දාමය සමාන වන අතර අසමමිතික කාබන් පරමාණුවක් දරණ සංයෝග වේ. C හි ප්‍රධාන කාබන් දාමය A, B හි ප්‍රධාන දාමයට වඩා කෙටිය. මෙම සංයෝග තුනම ආම්ලික $KMnO_4$ සමඟ ප්‍රතික්‍රියාවෙන් ලබාදෙන ඵල සියල්ලම $Na_2CO_3$ සමඟ $CO_2$ පිටකරයි.

A, B, C $LiAlH_4$ සමඟ ජල විච්ඡේදනයෙන් ලැබෙන සංයෝග පිළිවෙලින් D, E, F වේ. F පමණක් සා. $H_2SO_4$ සමඟ ක්‍රියා නොකරයි. D, E සාන්ද්‍ර $H_2SO_4$ සමඟ ක්‍රියාකර සාදන සංයෝග G, H වේ. G ව්‍යුහය $Cl_2$ සමඟ ක්‍රියා කර සෑදෙන සංයෝගය මධ්‍යසාරීය ප්‍රබල භෂ්මය සමඟ සාදනඵලය Na සමඟ $H_2$ වායුව පිටකරයි.

**A, B, C, D, E, F, G හා H හඳුනා ගන්න.**

A

B

C

D

E

F

G

H



Scanned with CamScanner

**(b)** පහත දැක්වෙන ප්‍රතික්‍රියාවල **ප්‍රධාන ඵලය** ලියන්න

**(i)** 


**(ii)** $CH_3-\overset{O}{\overset{\|}{C}}-NH_2 \xrightarrow[\text{2) ආම්ලික ජලය}]{\text{1) } LiAlH_4 \text{ / වි : ඊතර්}}$

(ප්‍රතික්‍රියාව I)

**(iii)** $CH_3-\overset{O}{\overset{\|}{C}}-Cl \xrightarrow{CH_3NH_2}$

**(iv)** $CH_3-\overset{OH}{\overset{|}{C}H}-CH_2-CH_3 \xrightarrow{\text{සාන්ද්‍ර } H_2SO_4}$

**(v)** 


(ප්‍රතික්‍රියාව II)

පහත දැක්වෙන ප්‍රතික්‍රියාවල ප්‍රතික්‍රියා වර්ගය දක්වන්න.

**(i)** ප්‍රතික්‍රියා I :- ..................................................................................................

**(ii)** ප්‍රතික්‍රියා II :- ..................................................................................................

**(C)** පහත ප්‍රතික්‍රියාවේ **යාන්ත්‍රණය** ලියන්න.

$CH_3Cl + Cl_2 \xrightarrow{\text{හිරු එළිය}} CH_2Cl_2 + HCl$

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................



Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි [All Rights Reserved]

විභාග අංකය - ..............................................

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department Of Examination Sabaragamuwa

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024
General Certificate Of Education (Adv.Level) Examination

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / Grade } 13 | විෂය / Subject } රසායන විද්‍යාව | පත්‍රය / Paper } II |

* සර්වත්‍ර වායු නියතය (R) $= 8.314\ JK^{-1}mol^{-1}$
* ඇවගාඩ්රෝ නියතය ($N_A$) $= 6.022 \times 10^{23}\ mol^{-1}$

## (B) කොටස - රචනා

- ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට **ලකුණු** 150 බැගින් ලැබේ)

**05. (a)** සම්මත තත්ත්ව යටතේදී, M යනු ඝන ලෝහයකි.X අලෝහය පවතින්නේ වායුමය $X_2$ ලෙසය.

M වලින් $M^+$ අයන සාදන අතර X වලින් $X^-$ අයන සාදයි.

MX යනු ඝන අයනික සංයෝගයකි.

**(i)** පහත සම්මත දත්ත යොදාගනිමින් MX(s) වල සම්මත දැලිස් විඝටන එන්තැල්පිය තාප රසායනික චක්‍රයක් මගින් ගණනය කරන්න.

| | |
|---|---|
| M වල ඌර්ධවපාතන එන්තැල්පිය | $+85\ kJmol^{-1}$ |
| M වල පළමු අයනීකරණ එන්තැල්පිය | $+430\ kJmol^{-1}$ |
| $X_2$ වල බන්ධන විඝටන එන්තැල්පිය | $+242\ kJmol^{-1}$ |
| X වල පළමු ඉලෙක්ට්‍රෝන කරන එන්තැල්පිය | $-349\ kJmol^{-1}$ |
| MX(s) වල උත්පාදන එන්තැල්පිය | $-485\ kJmol^{-1}$ |

**(ii)** පහත සම්මත එන්තැල්පි දත්ත ද යොදා ගෙන MX(s) වල සම්මත මවුලික ද්‍රාවණ එන්තැල්පිය ගණනය කරන්න.

මේ සඳහා තාප රසායනික චක්‍රයක් යොදා ගන්න.

$M^+_{(g)}$ හා $X^-_{(g)}$ වල සජලන එන්තැල්පි විපර්යාසය -430 හා $-350\ kJmol^{-1}$

**(iii)** පහත ප්‍රතික්‍රියාවේ සම්මත එන්ට්‍රොපි වෙනස $+10\ Jk^{-1}mol^{-1}$ නම් මෙම ප්‍රතික්‍රියාවේ $\Delta G$ 27°C ගණනය කරන්න.

$$MX_{(s)} \longrightarrow M^+_{(aq)} + X^-_{(aq)}$$

**(iv)** ඉහත ප්‍රතික්‍රියාවේ 27°C දී ජල ද්‍රාවනාව ස්වයංසිද්ධවේදැයි කෙටියෙන් පහදන්න.

Scanned with CamScanner

**(b)** $2A_{(g)} \rightleftharpoons B_{(g)} + C_{(aq)}$ යන ප්‍රතික්‍රියාව $A_{(g)}$ වලින් 0.2 mol ආරම්භ කර ආරම්භක මවුල කොටසක් වියෝජනයෙන් $1dm^3$ දෘඪ බඳුනක 300K දී $B_{(g)}$ හා $C_{(g)}$ සාදයි. මිනිත්තු 15 පසු පද්ධතිය සමතුලිත වන අතර එවිට $B_{(g)}$ මවුල ආරම්භක $A_{(g)}$ මවුල වලින් 25% ඇති බව සොයා ගැනිනි.

**(i)** $K_C$ ගණනය කර එනයින් Kp සොයන්න.

**(ii)** නියත උෂ්ණත්වයේ මිනිත්තු 30දී පද්ධතියට A මවුල 0.2 mol එකතු කරයි. එම මොහොතේ $Q_C$ අගය ගණනය කරන්න.

නව සමතුලිතය ඇතිවීමට ප්‍රතික්‍රියාව සිදුවන දිශාව $Q_C$ ඇසුරෙන් පහදන්න.

**(iii)** මිනිත්තු 50 දී පද්ධතිය නව සමතුලිතය ලබා ගනී. එවිට සමතුලිත A, B, C වායු මවුල සොයන්න.

**(iv)** කාලය 70 min වලදී පද්ධතියට He මවුල 0.2 එකතු කරයි. එවිට A, B, C සමතුලිත සාන්ද්‍රණ අඩු, වැඩි වෙනස් නොවීම පිළිබඳ අදහස් හේතු දක්වමින් ලබාදෙන්න.

**(v)** කාලය t, t = 0 සිට t = 60 min දක්වා ඉහත A, B, C වායු වල සාන්ද්‍රණය වෙනස්වන ආකාරය පෙන්වන ක්‍රමාංකනය කරන ලද ප්‍රස්තාරය අඳින්න.

**06. (a)** මෙතිල් ඇමයින් භෂ්මය ($CH_3NH_2$) ජලීය ද්‍රාවණයේදී දුබල ලෙස අයනීකරණයට ලක් වේ. ප්‍රාථමික ඇමීන ලෙස හැසිරෙමින් 0.20 $moldm^{-3}$ HCl සමග මෙතිල් ඔරේන්ජ් හමුවේ සිදුකල අනුමාපනයේදී පහත දත්ත ලබා දී ඇත.

**I.** ආරම්භක අනුමාපන ප්ලාස්කුවේ 25 $cm^3$ ($CH_3NH_2$) හි pH අගය 11.48 කි.

**II.** බියුරෙට්ටු පාඨාංකය 7.50 $cm^3$ වන විට අනුමාපන ප්ලාස්කුවේ ද්‍රාවණයේ වර්ණය **ලා කහ** පැහැයට හැරී තිබුනි.

**III.** බියුරෙට්ටු පාඨාංකය 11.25 $cm^3$ දී අනුමාපන ප්ලාස්කුව තුල පැහැදිලි අවර්ණ ද්‍රාවණයක් තිබූ අතර බියුරෙට්ටුවෙන් කුඩා පරිමාවක් එක්කල විට ද්‍රාවණය **රතු** පැහැයට හැරිණ.

($CH_3NH_2 - K_b = 1 \times 10^{-4}\ moldm^{-3}$, $K_w = 1 \times 10^{-14}\ mol^2dm^{-6}$)

**(i)** ආරම්භක $CH_3NH_2$ හි සාන්ද්‍රණය ගණනය කරන්න.

**(ii)** **II** දත්තය අනුව අනුමාපන ප්ලාස්කුවේ pH **අගය** ගණනය කරන්න.

**(iii)** **III** දත්තයට අනුව අනුමාපනයේ දී භාවිතාවන අවස්ථාව නම් කර pH **අගය** ගණනය කරන්න.

Scanned with CamScanner

**(b)** ප්‍රතික්‍රියක ප්‍රතිඵල බවට පත්වන විට සෑදෙන "සක්‍රිය සංකීර්ණය" යන්න අර්ථ දක්වන්න.

**(ii)** දුබල භාෂ්මික මෙතිල් ඇමයින් සමග හයිඩ්‍රොක්ලෝරික් අම්ලය අතර ප්‍රතික්‍රියාව සලකන්න. එහි තාප දායක /තාප අවශෝෂක බව සලකමින් එම ප්‍රතික්‍රියාවේ **ශක්ති පැතිකඩ** පෙන්වන්න.

(ඉදිරි ප්‍රතික්‍රියාවේ **සක්‍රියන ශක්තිය** $E_1$, **එන්තැල්පිය** $\Delta H_1$ ලෙස සලකන්න)

(සෑදෙන හා කැඩෙන බන්ධන ( - - - ) කඩ ඉරි මගින් දක්වන්න)

**(c)** ද්‍රව කලාපයේ A හා B ද්‍රව – වාෂ්ප සමතුලිතතාව ඇති පද්ධතියක සමතුලිතව පවතින වායු කලාපයේ මුළු පීඩනය $1.5 \times 10^5$ Pa බව දී ඇත. A හා B සංතෘප්ත වාෂ්ප පීඩන පිළිවෙලින් $P_A^0$ හා $P_B^0$ බව දී ඇත.

**(i)** වායු කලාපයේ $A_{(g)}$ හි මවුල භාගය $B_{(g)}$ හි මවුල භාගය මෙන් 4 ගුණයක් වේ නම් A හි ආංශික පීඩනය ($P_A$), $P^o_A$ ඇසුරින් ද්‍රව කලාපයේ A මවුල භාගය ($X_A$) සොයන්න.

**(ii)** $P_A$ / $P_B$ සොයන්න.

**(iii)** $P_A^0 = 5\ P_B^0$ නම් $P^o_A$ හි අගය සොයන්න.

**07. (a) (i)** ප්‍රාථමික කෝෂ, ද්විතික කෝෂ හඳුන්වන්න.

**(ii)** ධාරාව ලබාගන්නා විට සාමාන්‍ය ලෙක්ලාන්ෂ් කෝෂයේ ඇනෝඩ, කැතෝඩ, කෝෂ ප්‍රතික්‍රියා හඳුනා ගන්න.

**(b)** සම්මත $M/M^{2+}_{(aq)}$ ඉලෙක්ට්‍රෝඩයේ විභවය මැනීමට කැලමල් ඉලෙක්ට්‍රෝඩයක් සැසඳුම් ඉලෙක්ට්‍රෝඩයක් ලෙස භාවිතා කර ඇත. (සැසඳුම් ඉලෙක්ට්‍රෝඩයක් වඩා ධන විභවයක පවතී)




**(i)** භෞතික අවස්ථා සහිතව A, B, C, D හඳුනා ගන්න.

**(ii)** E සඳහා සුදුසුම උපකරණය නම කුමක්ද? එය තෝරා ගැනීමට හේතුව ලියන්න.

**(iii)** කැල්මල් ඉලෙක්ට්‍රෝඩය සම්මත ඉලෙක්ට්‍රෝඩ විභවය 0.27 V ද ඉහත කෝෂයේ විද්‍යුත් ගාමක බලය 1.03V ද නම් $M/M^{2+}$ ඉලෙක්ට්‍රෝඩයේ විභවය ගණනය කරන්න.

Scanned with CamScanner

**(iv)** ඉහත කෝෂය කාර්යය කරන විට ඇනෝඩ, කැතෝඩ, කෝෂ ප්‍රතික්‍රියා හඳුනා ගන්න.

**(v)** ඉහත කෝෂයෙන් 9.65 A ධාරාවක් පැයක් තුළ ක්‍රියාත්මක කල විට ජලීය කලාපයේ $M^{2+}$ අයන සාන්ද්‍රණය සෛධාන්තිකව ගණනය කරන්න.

(Mවල සාපේක්ෂ පරමාණුක ස්කන්ධය = 65)

1F =96 500 (C mol$^{1}$)

**(vi)** ඉහත $M^{2+}{}_{(aq)}$ ද්‍රාවණයට පහත ජලීය ද්‍රාවණ එකතු කරන විට කෝෂයේ විද්‍යුත් ගාමක බලය අඩුවේද, වැඩිවේද, වෙනස් නොවේද යන්න ගුණාත්මකව පහදන්න.

**i.** 1 moldm$^{-3}$ $MCl_2$ 50 cm$^3$ **ii.** 2 moldm$^{-3}$ $MCl_2$ 50 cm$^3$

**iii.** ආසුත ජලය 50 cm$^3$

4

**(c)** ආවර්තිතා වගුවේ M යන පරමාණුක ක්‍රමාංකය 30 අඩු මූලද්‍රව්‍යයකි. එහි ප්‍රධාන කැට අයන 2 ක් සාදන අතර ඉන් එකක් ජලීය KI සමග සුදු අවක්ෂේපය ($P_1$) සාදයි. අනෙක් කැට අයනය ජලීය KI සමග ජලීය මාධ්‍යයේදී රිඩොක්ස් ප්‍රතික්‍රියාවක් දක්වයි. එම කැට අයනය $NH_4OH$ එකතු කරන විට පළමුව වර්ණවත් $P_2$ අවක්ෂේපයද සාදන අතර $P_2$ ට වැඩිපුර $NH_4OH$ එකතු කල විට අවක්ෂේපය දියවෙමින් වර්ණවත් ද්‍රාවණයක්ද සාදයි. මෙම වර්ණයට හේතු කාරක වන්නේ $S_2$ අයනයයි.**නිවැරදි රසායනික සංකේත** භාවිතා කරමින් ,

**(i)** M, $P_1$, $P_2$, $S_2$ හඳුනා ගන්න.

**(ii)** M සාදන කැට අයන 2 හඳුනා ගන්න.

**(iii)** M හි සංයුජතාව ඉහළ කැටඅයනය ජලීය ද්‍රාවණවල පෙන්වන වර්ණය හඳුනාගෙන එම වරණයට හේතුකාරක $S_1$ කැට අයනයේ රසායනික සූත්‍රයද IUPAC නමද ලියන්න. $S_1$ ට සාන්ද්‍ර HCl එකතු කල විට වර්ණය වෙනස් වෙමින් නව වර්ණවත් ද්‍රාවණයක් සාදයි. මෙම වර්ණයට හේතු කාරක $S_3$ අයනයෙහි IUPAC නම ලියන්න. වර්ණයද සඳහන් කරන්න.

**(iv)** M හි සංයුජතාව ඉහළ කැට අයනයට $NH_4OH(aq)$ බින්දු වශයෙන් එකතු කරන විට දකින නිරීක්ෂණ පැහැදිලි කිරීමට තුලිත සමීකරණ ලියන්න.

**(v)** M හි සංයුජතාව ඉහළ කැට අයනය අඩංගු ජලීය ද්‍රාවණයක එය ප්‍රමාණාත්මකව හඳුනාගැනීම සඳහා සාන්ද්‍රණය සෙවීමට පහත රසායන ද්‍රව්‍ය යොදාගන්නේ කෙසේදැයි ගණනය සහිතව පෙන්වා දෙන්න.

ජලීය KI, සාන්ද්‍රණය C වන $Na_2S_2O_{3(aq)}$, පිෂ්ඨ ද්‍රාවණ, ජලය, M හි අගය අඩංගු ජලීය ද්‍රාවණය

Scanned with CamScanner

## (C) කොටස - රචනා

o ප්‍රශ්න **දෙකකට පමණක්** පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට **ලකුණු** 15 බැගින් ලැබේ)

**08. (A) (i)** පහත සඳහන් කාබනික සංයෝග හා ප්‍රතිකාරක **පමණක්** භාවිතා කරමින් පහත සංයෝගය සංස්ලේෂණය කිරීම පියවර **9 කට නොවැඩි** ගණනකින් සිදු කරන්න.




$LiAlH_4$, $H_2O$, $PCl_3$, Mg/ඊතර්
නිර්. $AlCl_3$, $CH_3-\overset{O}{\overset{||}{C}}-Cl$, $H^+/H_2O$
සා. $NH_3$, 

**(ii)** පහත පරිවර්තනය පියවර **4 කට නොවැඩි** පියවර ගණනකින් සිදු කරන්න.

$$CH_3-\overset{H}{\overset{|}{C}}=CH_2 \longrightarrow CH_3-C\equiv C-CH_3$$

**(B)** පහත ප්‍රතික්‍රියා අනුක්‍රමණය සලකන්න.




**(i)** R, S, T, U **කාබනික** ප්‍රතිඵල L, M යන ප්‍රතිකාරකත් හඳුනා ගන්න.

**(ii)** U ආකාරයේ සංයෝග සමග ප්‍රතික්‍රියා කරන බහුලව භාවිතා වන **ලෝහය/ ලෝහ** හඳුනා ගන්න.

**(iii) ප්‍රතික්‍රියාව** I සඳහා යාන්ත්‍රණය ලියන්න.

**(C)** $CH_3-\overset{O}{\overset{||}{C}}-NH_2$ හා $CH_3-CH_2NH_2$ අතරින් වඩා **භාෂ්මික** කුමක්දැයි හේතු දක්වමින් පහදන්න.

**09. (a)** M යනු 3d ගොනුවේ ලෝහයක් වන අතර එය සාදනු ලබන A නම් ලවණයකට තනුක අම්ලයක් යෙදීමේදී රෝස පැහැති B නම් පැහැදිලි ද්‍රාවණය සාදමින් C නම් අවර්ණ වායුවක් පිට කරයි. මෙම C වායුව $Ca(OH)_2$ තුලින් යැවූ විට සුදු පැහැති අවක්ෂේපයක් සාදයි. B ද්‍රාවණයට NaOH යොදා මද වේලාවක් තැබූ විට D නම් කළු දුඹුරු පැහැති අවක්ෂේපයක් සෑදුණි. මෙම B ද්‍රාවණයට සාන්ද්‍ර HCl වැඩිපුර යෙදීමේදී E නම් කහ – කොළ පැහැති ද්‍රාවණය සෑදුණි.

5

Scanned with CamScanner

මෙහි C වායුවේ ජලීය ද්‍රාවණයකට X නම් වායුව බුබුලනය කළ විට F නම් ලා කහ ආවිලතාවයක් ලබා දුණි. C වායුව වැඩිපුර ජලයේ දියකර එයට $BaCl_2$ යෙදූවිට, තනුක අම්ලයක ද්‍රාව්‍ය G නම් සුදු පැහැති අවක්ෂේපයක් සෑදෙන අතර, එම C වායුවේ ජලීය ද්‍රාවණයකට M ලෝහය අඩංගු වෙනත් සංයෝගයක් වන Y යොදා ඉන්පසු නැවත $BaCl_2$ යෙදූ විට තනුක අම්ල වල අද්‍රාව්‍ය සුදු පැහැති H අවක්ෂේපය සෑදුණි. මෙම Y සංයෝගය තුළ M ද ඇතුළුව මූලද්‍රව්‍ය 3 ක් අඩංගු වන අතර අනුපාතය **1 : 1 : 4** වේ.

**(i)** M **ලෝහය** හඳුනාගන්න.

**(ii)** A, B, C, D, E, F, G හා H හඳුනා ගන්න. (හේතු අවශ්‍ය නැත)

**(iii)** X හා Y හි රසායනික සූත්‍ර ලියන්න.

**(iv)** C හා X වායු අතර සහ C වායුව සමග Y හි තුලිත රසානික ප්‍රතික්‍රියා ලියන්න.

**(b)** X නැමති ඝන ලෝහ ලවණයක් සඳහා සිදුකළ පරීක්ෂණ සහ එහි නිරීක්ෂණ පහත වගුව තුල දැක්වේ. (ලෝහ ලවණය තුල එක් කැටායනයක් සහ ඇනායනයක් පමණක් පවතී)

| **පරීක්ෂණ අංකය** | **පරීක්ෂණය** | **නිරීක්ෂණය** |
|---|---|---|
| **01.** | X හි ඝන සාම්පලයක් ගෙන එයට $HNO_3$ යොදා රත් කරන ලදී. | ඝණ ලවණය දියවී ජලීය ද්‍රාවණයක් සාදයි. |
| **02.** | ඉහත (i) හි ද්‍රාවණයට $NH_4OH$ හා $NH_4Cl$ යොදන ලදී. | දුඹුරු පැහැති අවක්ෂේපයක් වන S සෑදුණි. |
| **03.** | ඉහත X ලවණයට ආම්ලික $KMnO_4$ ජලීය ද්‍රාවණයකින් එක් කරන ලදී. | ජලීය ද්‍රාවණයක් සෑදුනු අතර වායු බුබුලු පිට විය. |
| **04.** | ඉහත (3) හි පිටවූ වායුව $Ca(OH)_2$ ද්‍රාවණයක් හරහා යවන ලදී. | ජලීය ද්‍රාවණය තුළ සුදුපැහැති (කිරිපැහැ) අවලම්බනයක් සාදන ලදී. වැඩිපුර වායුව බුබුලනය කළ විට කිරි පැහැය නැති වී අවර්ණ විය. |

**(i)** X ලවණය හඳුනා ගන්න.

**(ii)** ඉහත පරීක්ෂණ 3 හා 4 ට අදාළ සියලු රසායනික ප්‍රතික්‍රියා ලියා දක්වන්න.

Scanned with CamScanner

**(C)** එක්තරා පිරිසිදුකාරක ද්‍රාවණ සාම්පලයක් තුළ ෆීනෝල් අඩංගු වන අතර එහි ෆීනෝල්වල ස්කන්ධ ප්‍රතිශත සංශුද්ධතාව සෙවීම සඳහා පහත පරීක්ෂණය සිදු කරන ලදී.

ඉහත පිරිසිදුකාරක සාම්පලයෙන් 0.20g ගෙන එය ජලය 250.0 $cm^3$ ක් තුළ දියකර එයින් 25.0 $cm^3$ ක් ප්ලාස්කුවට මැනගෙන 0.02 $moldm^3$ $KBrO_3$ වලින් 25.0 $cm^3$ ක් සහ වැඩිපුර KBr යොදා ආම්ලික කර හොඳින් මිශ්‍ර කරන ලදී. මෙහිදී සෑදුණු $Br_2$, ෆීනෝල් සමග ප්‍රතික්‍රියා කර 2, 4, 6 – tribromophenol සාදයි.




ඉන් පසු ඉහත ද්‍රාවණයට වැඩිපුර KI එකතු කර එය සාන්ද්‍රණය 0.01 $moldm^{-3}$ ක් වන $Na_2S_2O_3$ ද්‍රාවණයක් සමග අනුමාපනය කළ විට වැය වූ $Na_2S_2O_3$ පරිමාව 20.0 $cm^3$ වේ.

**(i)** සිදුවන සියලුම ප්‍රතික්‍රියා සඳහා තුලිත අයනික ප්‍රතික්‍රියා ලියන්න.

**(ii)** අන්ත ලක්ෂ්‍යයේදී වැයවන $Na_2S_2O_3$ මවුල ගණන සොයන්න.

**(iii)** පිරිසිදුකාරක ද්‍රාවණයේ අඩංගු ෆීනෝල්හි ස්කන්ධ ප්‍රතිශතය ගණනය කරන්න.
(C = 12, H = 1, O = 16, K = 39)

**10. (a)** පොහොර නිෂ්පාදනය සඳහා $NH_3$ (ඇමෝනියා) බහුලවම භාවිතා කරයි. ඇමෝනියා නිෂ්පාදන "හේබර් - බෝෂ්" ක්‍රමය සලකන්න.

**(i)** මෙම ක්‍රියාවලිය සඳහා භාවිතාවන අමුද්‍රව්‍ය නම් කරන්න.

**(ii)** යම් අමුද්‍රව්‍යයක් (Raw material) තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 2 ක් ලියන්න.

**(iii)** කාර්මිකව මෙම ක්‍රමය මගින් ඇමෝනියා නිෂ්පාදනයේදී භාවිතා වන ප්‍රශස්ථ උෂ්ණත්වය, පීඩන හා උත්ප්‍රේරක මොනවාද?

**(iv)** මෙම ක්‍රමයේදී $NH_3$ (ඇමෝනියා) සෑදෙන කාර්යක්ෂමතාව වැඩි කිරීමට ගෙන ඇති පියවරක් සඳහන් කරන්න.

**(v)** පහත ගැලීම් සටහන සලකන්න.




S - උත්ප්‍රේරකයකි.

E – N අඩංගු පොහොර වශයෙන් භාවිතා කරයි.



Scanned with CamScanner

**(vi) (i)** ඉහත ගැලීම් සටහන තුළ A, B, C, D හා E හඳුනාගෙන නම් කරන්න.

**(ii)** S උත්ප්‍රේරකය සහ පියවරට අදාළ උෂ්ණත්වය ලියන්න.

**(b)** පහත එක් එක් පාරිසරික ගැටලු සඳහා බලපෑම් ඇති කරවන වායූන් / සංයෝග 2 බැගින් ලියන්න.

**(i)** ආම්ලික වැසි (Acid Rain)

**(ii)** ප්‍රකාශ රසායනික ධූමිකා (PCS)

**(iii)** ගෝලීය උණුසුම ඉහළ යාම (Global Warming)

**(iv)** ඕසෝන් ස්ථරය ක්ෂය වීම (OLD)

**(v)** ජලය සුපෝෂණය (Eutrophication)

**ඔබ ඉහත අම්ලවැසි සඳහා ඉදිරිපත් කළ වායු / සංයෝග වලින් අම්ල වැසි ඇති කරන** ආකාරය තුලිත රසායනික සමීකරණ මගින් පෙන්වා දෙන්න.

**(c) (i)** ස්වභාවික ආකලන බහු අවයවිකයක් වන ස්වභාවික රබර් තුළ සිස් – පොලිඅයිසොප්‍රීන් (Cis-Polyisoprene) පවතී. මෙහි පුනරාවර්තන ඒකකය ඇඳ දක්වන්න.



අයිසොප්‍රීන්

**(ii)** පොලි එතිලින් ටෙරිතැලේට් (PET) බහු අවයවිකයේ පුනරාවර්ථන ඒකකය පහත දැක්වෙන අතර දළ වශයෙන් මෙම බහු අවයවිකයේ සාමාන්‍ය මවුලික ස්කන්ධය 12 kg $mol^{-1}$ පමණ වේ යැයි ගනිමින් මවුලයක පවතින පුනරාවර්තන ඒකක සංඛ්‍යාව (n) ගණනය කරන්න.

(C = 12, H = 1, O = 16)



PET පුනරාවර්ථන ඒකකය



Scanned with CamScanner

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 **H** | | | | | | | | | | | | | | | | | 2 **He** |
| 2 | 3 **Li** | 4 **Be** | | | | | | | | | | | 5 **B** | 6 **C** | 7 **N** | 8 **O** | 9 **F** | 10 **Ne** |
| 3 | 11 **Na** | 12 **Mg** | | | | | | | | | | | 13 **Al** | 14 **Si** | 15 **P** | 16 **S** | 17 **Cl** | 18 **Ar** |
| 4 | 19 **K** | 20 **Ca** | 21 **Sc** | 22 **Ti** | 23 **V** | 24 **Cr** | 25 **Mn** | 26 **Fe** | 27 **Co** | 28 **Ni** | 29 **Cu** | 30 **Zn** | 31 **Ga** | 32 **Ge** | 33 **As** | 34 **Se** | 35 **Br** | 36 **Kr** |
| 5 | 37 **Rb** | 38 **Sr** | 39 **Y** | 40 **Zr** | 41 **Nb** | 42 **Mo** | 43 **Tc** | 44 **Ru** | 45 **Rh** | 46 **Pd** | 47 **Ag** | 48 **Cd** | 49 **In** | 50 **Sn** | 51 **Sb** | 52 **Te** | 53 **I** | 54 **Xe** |
| 6 | 55 **Cs** | 56 **Ba** | **La-Lu** | 72 **Hf** | 73 **Ta** | 74 **W** | 75 **Re** | 76 **Os** | 77 **Ir** | 78 **Pt** | 79 **Au** | 80 **Hg** | 81 **Tl** | 82 **Pb** | 83 **Bi** | 84 **Po** | 85 **At** | 86 **Rn** |
| 7 | 87 **Fr** | 88 **Ra** | **Ac-Lr** | 104 **Rf** | 105 **Db** | 106 **Sg** | 107 **Bh** | 108 **Hs** | 109 **Mt** | 110 **Ds** | 111 **Rg** | 112 **Cn** | 113 **Nh** | 114 **Fl** | 115 **Mc** | 116 **Lv** | 117 **Ts** | 118 **Og** |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 57 **La** | 58 **Ce** | 59 **Pr** | 60 **Nd** | 61 **Pm** | 62 **Sm** | 63 **Eu** | 64 **Gd** | 65 **Tb** | 66 **Dy** | 67 **Ho** | 68 **Er** | 69 **Tm** | 70 **Yb** | 71 **Lu** |
| 89 **Ac** | 90 **Th** | 91 **Pa** | 92 **U** | 93 **Np** | 94 **Pu** | 95 **Am** | 96 **Cm** | 97 **Bk** | 98 **Cf** | 99 **Es** | 100 **Fm** | 101 **Md** | 102 **No** | 103 **Lr** |

Scanned with CamScanner